විෂය Subject - දේශීය නර්තනය Oriental Dance

ශ්‍රේණිය Grade - 10

කාලච්ඡේද Periods - 60

| | නිපුණතාව | ක්‍රියාකාරකම | අත්‍යාවශ්‍ය ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| 9 ශ්‍රේණිය 11 වාරය | 1.0<br>පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි. | **1.3**<br>**පත් නෙළීම / ගොයම් කැපීමේ නැටුම නිර්මාණය කරමු.** | • පත් නෙළීම / ගොයම් කැපීම නැටුම හා සබැඳි සුවිශේෂ ලක්ෂණ නම් කරයි.<br>• උපකරණ නිවැරදි ව භාවිත කරයි.<br>• නර්තනයේ දී අවකාශය උචිත පරිදි භාවිත කරයි.<br>• සාමූහිකව ඉදිරිපත් කරන ලද නර්තන අංග අගයමින් අදහස් ඉදිරිපත් කරයි | • පත් නෙළීම / ගොයම් කැපීම නැටුම හා සබැඳි සුවිශේෂ ලක්ෂණ<br>• උපකරණ භාවිතයේ නියම විධික්‍රම<br>• ගායනය සහිත සාමූහික නර්තන නිර්මාණ<br>• ගායනය හා වාදනය | 02 |
| | 3.0<br>සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශන කරයි. | **3.2**<br>**සතර බීජාක්ෂර හා සරඹ පද වාදනය කරමු.** | • සතර බීජාක්ෂර මුල් කරගත් සරඹ පද තාල තබමින් කියයි.<br>• එම සරඹ පද තාලයට අනුව වාදනය කරයි.<br>• මැදුම් තනිතිතට අයත් බෙර පද නම් කරයි.<br>• මැදුම් තනිතිතට බෙර පද වාදනය කරයි.<br>• ඒකලව හා සාමූහික ව බෙර පද වාදනය කරයි. | • සතර බීජාක්ෂර මුල් කරගනිමින් සරඹ පද වාදනය<br>• මැදුම් තනි තිතට බෙර පද වාදනය (ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අනුව) | 02 |
| | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.5.1**<br>**වන්නම් / සින්දු වන්නම් නර්තනය කරමු**<br>**(සිංහරාජ / අනුරාගදණ්ඩ තාලය / විරාඩි වන්නම)** | • බෙර වාදනයට අනුව නිවැරදි නාදමාලාව අනුගමනය කරමින් අදාළ වන්නමේ කවි ගායනය කරයි.<br>• නියමිත තාල රූපයට අනුව නිවැරදි අංගහාර අනුගමනය කරමින් අලංකාර පද නිර්මාණය කරයි. | • සිංහරාජ වන්නම/ අනුරාගදණ්ඩ තාලය සින්දු වන්නම/ විරාඩි පක්ෂි වන්නම සම්පූර්ණයෙන් නැටීම. | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | • සිංහරාජ වන්නම/ අනුරාගදණ්ඩ තාලය සින්දු වන්නම/ විරාඩි පක්ෂි වන්නමට අදාළ කස්තිරම / ඉරට්ටිය / කලාසම තාල තබා කියයි.<br>• සිංහරාජ වන්නම/ අනුරාගදණ්ඩ තාලය සින්දු වන්නම/ විරාඩි පක්ෂි වන්නමට අදාළ කස්තිරම / ඉරට්ටිය / කලාසම නර්තනය කරයි.<br>• නිවැරදි අංගහාර අනුගමනය කරමින් බෙර වාදනයට අනුව ගයමින් වන්නම සම්පූර්ණයෙන් නර්තනය කරයි.<br>• සාමූහිකව හා ඒකලව අභ්‍යාසයේ යෙදෙමින් කුසලතා වර්ධනය කරගනියි. | | |
| | 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | **5.1**<br>**නර්තන කලාව හා සබැඳි මූලාශ්‍රය හඳුනා ගැනීම** | • සෙල් ලිපි හා සන්දේශ කාව්‍ය ඇතුළත් යුග නම් කරයි.<br>• මූලාශ්‍රයවල අන්තර්ගත සාධක ඉදිරිපත් කරයි.<br>• එම සාධක ඇසුරෙන් නර්තන කලාව පැවති තත්ත්වය පිළිබඳ අදහස් දක්වයි.<br>• සාහිත්‍ය කෘතියක් ලෙස සන්දේශ කාව්‍ය අගයමින් අදහස් දක්වයි.<br>• සන්දේශ කාව්‍යවල සිද්ධි ඇසුරින් නර්තන නිර්මාණය කළ හැකි බව ප්‍රකාශ කරයි. | • මූලාශ්‍රය - සෙල්ලිපි (සැස්සේරුව, කොරවක්ගල, පාලමොට්ටායි)<br>• සන්දේශ කාව්‍ය (තිසර, සැලළිහිණිය) | 03 |
| | 1.0<br>පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි. | **1.2**<br>**භාව (ශෝකය) ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණය කරමු.** | • ශෝකය නමැති ස්ථායි භාවය දක්නට ලැබෙන අවස්ථා නම් කරයි.<br>• ශෝකය නමැති ස්ථායි භාවය ප්‍රකාශ කරන ආකාරය පිළිබඳ අදහස් දක්වයි.<br>• ශෝකය නමැති ස්ථායි භාවය ප්‍රකාශ කිරීමට සුදුසු සිද්ධියක් නිර්මාණය කරයි.<br>• සිද්ධියට අදාළ චරිත සඳහා චලන නිර්මාණය කරයි.<br>• භාවය ප්‍රකාශනය වන පරිදි චරිත නිරූපණය කරයි. | • ශෝකය නමැති ස්ථායි භාවය ඉස්මතුවල අවස්ථා<br>• ශෝකය නමැති ස්ථායි භාවයෙහි සුවිශේෂ ලක්ෂණ<br>• උචිත සිද්ධියක් ගොඩනැගීම.<br>• භාව ප්‍රකාශනය (ශෝකය) | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | • ඉදිරිපත් කරන ලද නිර්මාණය පිළිබඳ විචාරාත්මකව අදහස් දක්වයි. | | |
| **9 ශ්‍රේණිය 111 වාරය** | 3.0<br>සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශන කරයි. | **3.3.1**<br>**පංචතූර්ය වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු රැස් කරමු.** | • පංචතූර්ය වාද්‍ය භාණ්ඩ වර්ග කර දක්වයි.<br>• පංචතූර්ය වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු රැස් කර පිටු පෙරළනයක් සකස් කරයි. | • පංචතූර්ය වාද්‍ය භාණ්ඩ වර්ගීකරණය<br>  • ආතත<br>  • විතත<br>  • විතතාතත<br>  • ඝණ<br>  • සුසිර<br>• වාදනය කරන අවස්ථා | 02 |
| | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.4**<br>**බෙර පද, වන්නම්. කවි ප්‍රස්තාර කිරීම. (පන්, ගොයම්, සොකරි, කඩතුරා කවි හා වෛරොඩි / ඊශ්වර කුණ්ඩ තාලය / කදම්හ පක්ෂි වන්නම්)** | • මාත්‍රා 3 තනි තිතේ තාලයට අදාළ කස්තිරම් /සීරුමාරු/ අඩව් / ඉරට්ටි/ කලාසම ප්‍රස්තාර කරයි.<br>• මාත්‍රා 3+4 තාලයට බෙර පද කවි පද ප්‍රස්තාර කරයි.<br>• අදාළ වන්නම් හා කවි ප්‍රස්තාර කරයි. | • 8 ශ්‍රේණියේ ඉගෙන ගත් වන්නමේ කස්තිරම් /සීරුමාරු/ අඩව් / ඉරට්ටි/ කලාසම<br>• මාත්‍රා 3+4 තාලයට අදාළ බෙර පද/ දවුල් පද ප්‍රස්තාර<br>• පන්, ගොයම්, සොකරි, කඩතුරා කවි පද ප්‍රස්තාර | 02 |
| | 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | **5.2**<br>**අදාළ ශාන්තිකර්මය හඳුනා ගැනීම** | • අදාළ ශාන්තිකර්ම පැවැත්වීමේ හේතු දක්වයි. (අතීත, වර්තමාන)<br>• ශාන්තිකර්මවල පුරාවෘත්ත කතාව විස්තර කරයි.<br>• පුද ලබන දෙවිවරුන්, යකුන් නම් කරයි.<br>• ශාන්තිකර්මයේ අන්තර්ගත චාරිත්‍ර විධි, නර්තන, ගායන, වාදන, රංගවස්ත්‍රාභරණ, රංගභාණ්ඩ හා සැරසිලි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• ශාන්තිකර්ම පැවැත්වීමේ දී සාමූහිකත්වයෙන් කටයුතු කිරීම අගයමින් අදහස් ඉදිරිපත් කරයි. | • උගත් ශාන්තිකර්ම දෙකට අමතරව වෙනත් ශාන්තිකර්මයක තාරතුරු<br>**උඩරට - කොහොඹායක්කංකාරිය**<br>**පහතරට - දෙවොල් මඩුව**<br>**සබරගමු - පහන් මඩුව**<br>පුරාවෘත්ත කතාව, පැවැත්වීමට හේතු, පුද ලබන, දෙවිවරු සහ යකුන්, නර්තන, ගායන, වාදන, චාරිත්‍ර, | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | රංගභාණ්ඩ,<br>රංගවස්ත්‍රාභරණ | |
| | 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | **5.3**<br>**නර්තන ශිල්පීන් අගයමු** | • නර්තන ප්‍රවර්ධනයට දායකවී ඇති අයුරු විස්තර කරයි.<br>• ශිල්පීය කුසලතාව අගයමින් අදහස් දක්වයි. | • අරුනෝලිස් ඉඹුල්ගොඩ (උඩරට)<br>• විල්සන් ඔලබොඩුව (පහතරට)<br>යන ශිල්පීනගෙන් සාම්ප්‍රදායික නර්තන ප්‍රවර්ධනයට සිදුවූ සේවාව | 02 |
| | 6.0<br>රසඥතා වර්ධනව සඳහා විවිධ කලාංගවල සුවිශේෂී ලක්ෂණ විචාරයට ලක් කරයි. | **6.1**<br>**කථක් නර්තනයේ තොරතුරු රැස් කිරීම.** | • ප්‍රචලිත ප්‍රදේශ නම් කරයි.<br>• ආගමික හා සමාජයිය පසුබිම විස්තර කරයි.<br>• සංගීත සම්ප්‍රදාය හා වාද්‍ය භාණ්ඩ නම් කරයි.<br>• නර්තනය උගන්වන ආයතනය නම් කරයි.<br>• නර්තන අංග හා රංගවස්ත්‍රාභරණ පිළිබඳව අදහස් දක්වයි. | • කථක් නාට්‍යම් සම්ප්‍රදාය<br>• ප්‍රචලිත ප්‍රදේශ<br>• ආගමික පසුබිම හා විකාශනය<br>• සංගීත සම්ප්‍රදාය<br>• වාද්‍ය භාණ්ඩ<br>• නර්තන අංග සහ<br>• රංගවස්ත්‍රාභරණ<br>• නර්තන උගන්වනු ලබන ආයතන | 02 |
| | 7.0<br>විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි. | **7.2**<br>**ගීතයට අනුව නර්තන නිර්මාණය** | • ගීතයට උචිත චලන යොදා ගනිමින් නර්තන නිර්මාණ කරයි.<br>• ඒකල හා සාමූහික වශයෙන් නර්තන අංගයක් නිර්මාණය කරයි.<br>• අවකාශය නිසි ලෙස යොදා ගනිමින් නිමාවක් සහිත නර්තන අංගයක් ඉදිරිපත් කරයි.<br>• ඉදිරිපත් කරන ලද නර්තන අංග පිළිබඳ ව අගයමින් අදහස් ප්‍රකාශ කරයි | • දීකිරි දීකිරි / රත්නදීප ජන්ම භූමි<br>• පද රචනය හා භාෂාව<br>• සංගීතය<br>• ගායනය<br>• ගීතයේ අර්ථය | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | 24 |
| 10 ශ්‍රේණිය<br>1 වාරය | 1.0<br>පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි. | 1.2.1<br>**ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනිගනිමින් නර්තන නිර්මාණ කරයි.** | • රබන්/ චාමර නැටුමේ සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.<br>• රබන් /චාමර නර්තනයට උචිත චලන නිර්මාණය කරයි.<br>• රංග උපකරණ නිවැරදිව හසුරවමින් නර්තන ඉදිරිපත් කරයි.<br>• සාමූහිකත්වයෙන් යුතුව නිමාවක් සහිත රබන් / චාමර නර්තන අංගයක් ප්‍රදර්ශණය කරයි.<br>• රබන්/ චාමර නර්තන නිර්මාණ පිළිබඳ විචාරාත්මකව අදහස් ඉදිරිපත් කරයි. | • රබන්/චාමර නැටුම හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනාගනිමින් නර්තන නිර්මාණය | 02 |
| | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.1.1<br>**සාම්ප්‍රදායික නර්තනය හා සබැඳි හස්ත පාද හැසිරවීමේ විධික්‍රම අනුගමනය කරමින් මූලික සරඹ ඉදිරිපත් කරයි.** | • ත්‍රිවිධ ලයට අනුව නියමිත ගොඩ සරඹ, ඉලංගම් සරඹ, දොඹින පද තාල තබමින් කියයි.<br>• අදාළ සරඹ බෙර වාදනයට අනුව නර්තනය කරයි.<br>• නිවැරදි විධි ක්‍රම අනුගමනය කරමින් සරඹ පද හා අදාළ කස්තිරම්/ඉරට්ටි / හමාර පදය ප්‍රදර්ශනය කරයි. | • ගොඩ සරඹ / ඉලංගම් සරඹ / දොඹින පද 1 - 12 දක්වා කස්තිරම්/ ඉරට්ටි/ හමාර පද සමගින්<br>• විලම්භ, මධ්‍ය හා දෘත ලයට අනුව | 02 |
| | 3.0<br>සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශන කරයි. | 3.1.1<br>**නිවැරදි ශිල්ප ක්‍රම අනුගමනය කරමින් බෙර වාදනය කරයි.** | • 1, 2 බෙර / දවුල් සරඹ පද තාල තබමින් කියයි.<br>• නිවැරදි අක්ෂර උත්පාදනය වන ආකාරයට බෙර / දවුල් සරඹ බද නාදනය කරයි.<br>• සුළු මැදුම් (මාත්‍රා 2+3) දෙතිතට බෙර/ දවුල් පද වාදනය කරයි. | • 1 -2 අදාළ බෙර සරඹ සුළු, මැදුම්(මාත්‍රා 2+3) දෙතිතට අයත් බෙර පද | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | • සාමූහික ව හා ඒකල ව හඬ පාලනය කරමින් වාදනය ඉදිරිපත් කරයි. | | |
| | 4.0<br>ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | **4.1.1**<br>**නිර්දේශිත ගායන හා සබැඳි සංස්කෘතික පසුබිම විස්තර කරයි.** | • රබන්, ඔංචිලි වාරම්, චාමර කවි ගායන හා බැඳි පසුබිම කෙටියෙන් දක්වයි.<br>• නමස්කාර ගාථා හා ටීකා සී පද කවි ගායනවල පසුබිම විස්තර කරයි.<br>• නිර්දිෂ්ට මෙම කවි ගායනවල වටිනාකම හඳුනා ගනිමින් ඒවා සංරක්ෂණය කිරීමට යෝජනා ඉදිරිපත් කරයි.<br>• අදාල කවි ගායනවල සුවිශේෂ ලක්ෂණ ප්‍රදර්ශනය කරයි. | • රබන්, ඔංචිලි වාරම්, චාමර කවි, ටීකා සී පද, නමස්කාර ගාථා හා බැඳි සංස්කෘතික පසුබිම | 02 |
| | 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | **5.1.1**<br>**ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සබැඳි ඓතිහාසික පසුබිම විග්‍රහ කරයි.** | • වංශකතා හා විදේශිකයන්ගේ වාර්තාවලින් නර්තන කලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු අනාවරණය කර ගත හැකි බව ප්‍රකාශ කරයි.<br>• නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබූ බව ඓතිහාසික මූලාශ්‍රයවල ඇති සාධක මඟින් ඉදිරිපත් කරයි.<br>• ආගමික හා සමාජයීය අවශ්‍යතා සඳහා නර්තන භාවිත කළ අයුරු ඓතිහාසික මූලාශ්‍රයවල සාධක ඇසුරෙන් විස්තර කරයි. | • විදේශිකයින්ගේ ඓතිහාසික වාර්තා<br>• මහා වංසයේ සාධක | 02 |
| | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.2.1**<br>**අලංකාර පද ගොඩ නගමු.** | ▪ අලංකාර පද නර්තනය සඳහා සුදුසු පද නිර්මාණය කරයි.<br>▪ නිර්මාණය කර ගත් චලන යොදා ගනිමින් සුළු මහ දෙතිතට අලංකාර පද (මාත්‍රා) නිර්මාණය කරයි. | • සුළු මහ දෙතිතට අදාළ බෙර පද ඇසුරින් අලංකාර පද (මාත්‍රා) දෙකක් | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ▪ නිර්මාණය කරන ලද අලංකාර පද(මාත්‍රා) වෙනත් නර්තන අවස්ථා සඳහා භාවිත කරයි.<br>▪ ගොඩ නගන ලද අලංකාර පද (මාත්‍රා) පිළිබඳව අදහස් ඉදිරිපත් කරයි. | | |
| 10 ශ්‍රේණිය<br>11 වාරය | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.3.1**<br>**නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.** | ▪ අදාල තිත් රූපය අනුව සැවුලා/ නාතිලිංචිතාලය/ මණ්ඩූක වන්නම්වල තානම් හා කවි නියමිත නාදමාලා අනුව ගායනව කරයි.<br>▪ තානම හා කවි ගයමින් පද නර්තනය කරයි.<br>▪ කස්තිරම/ ඉරට්ටිය/ කලාසම, සීරුමාරුව, අඩව්ව නර්තනයේ යෙදෙයි.<br>▪ වාදනයට අනුව සම්පූර්ණ වන්නම නර්තනය කරයි. | ● වන්නම් නර්තනය (සැවුලා/ නාතිලිංචිතාලය/ මණ්ඩූක වන්නම) | 02 |
| | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.4.1**<br>**ප්‍රස්තාරකරණයේ විධි ක්‍රම අනුගමනය කරයි.** | ▪ නියමිත කවි ගායන සහ නර්තන පද ප්‍රස්තාර කිරීමේ විධික්‍රම සාකච්ඡා කරයි.<br>▪ විධික්‍රම හා විවිධ ශිල්පක්‍රම භාවිත කරමින් අදාළ කවි හා නර්තන පද කොටස් ප්‍රස්තාර කරයි.<br>▪ නිවැරදිව ප්‍රස්තාරකරණයේ යෙදෙමින් තාල පිළිබඳ ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>▪ තුන් තිතේ ප්‍රභේද හඳුන්වයි. | ● බෙර පද හා කවි පද ප්‍රස්තාරය (වන්නම්, රබන් හා චාමර කවි) | 02 |
| | 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | **5.3.1**<br>**ශ්‍රී ලාංකේය ගැමි නාටක හා සබැඳි පසුබිම අධ්‍යයනය කර සුවිශේෂ ලක්ෂණ ඉදිරිපත් කරයි.** | ▪ සොකරි දේශීය ගැමි නාටකයක් බව ප්‍රකාශ කරයි.<br>▪ සොකරි නාටකය ප්‍රචලිත ප්‍රදේශ හා පැවැත්වීමේ අරමුණු විස්තර කරයි.<br>▪ සොකරි කථා ප්‍රවෘත්තිය හා චරිත නිරූපණ පිළිබඳ විචාරාත්මකව අදහස් දක්වයි.<br>▪ ගැමි නාටක අභාවයට යා නොදී ආරක්ෂා කරගැනීමට යෝජනා ඉදිරිපත් කරයි. | ● සොකරි ගැමි නාටකය | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 6.0<br>රසඥතා වර්ධනව සඳහා විවිධ කලාංගවල සුවිශේෂී ලක්ෂණ විචාරයට ලක් කරයි. | **6.2.1**<br>**ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍යය නරඹා විචාරයට ලක් කරයි.** | ▪ මුද්‍රා නාට්‍යයට පාදක වූ කතා පුවත විස්තර කරයි.<br>▪ කතා පුවතින් විද්‍යමාන ජීවන දැක්ම විස්තර කරයි.<br>▪ චරිත විකාශය සඳහා නර්තන යොදාගෙන ඇති ආකාරය පිළිබඳඅදහස් දක්වයි.<br>▪ කලාත්මක ලක්ෂණ තීව්‍ර කිරීම සඳහා සංගීතය, රංග වස්ත්‍රාභරණ, වේදිකා සැරසිළි, ආලෝකකරණය ආදිය යොදාගෙන ඇති ආකාරය විචාරාත්මක ව ඇගයීමට ලක් කරයි. | • කලා කෘතියක් රස විඳීම (කරදිය/ කුඹී කතාව) | 02 |
| | 4.0<br>ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | **4.1.1**<br>**රබන්, ඔංචිලි වාරම්, චාමර කවි ගයමු.** | • රබන්, ඔංචිලි වාරම්, චාමර කවි නිවැරදි නාදමාලා අනුව තාල තබමින් ගායනය කරයි.<br>• බෙර වාදනයට අනුව තාල තබමින් රබන්, ඔංචිලි වාරම්, චාමර කවි ගයනය කරයි.<br>• ඒකීය හඬතලය හා ස්වකීය හඬතලය හඳුනාගෙන කවි ගායනය කරයි. | • රබන්, ඔංචිලි වාරම් හා චාමර කවි | 02 |
| | 3.0<br>සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශන කරයි. | **3.2.1**<br>**සන්නිවේදන කාර්යය සඳහා වාද්‍ය භාණ්ඩ යොදාගැනීම පිළිබඳ තොරතුරු** | ▪ සන්නිවේදන කාර්යය සඳහා අතීතයේ සිට ම දේශීය වාද්‍ය භාණ්ඩ භාවිත කළ බව ප්‍රකාශ කරයි.<br>▪ සන්නිවේදන ක්‍රියාවලිය මුල් කොට ගෙන වාදන අවස්ථා නම්කොට ඇති බව ප්‍රකාශ කරයි.<br>▪ එම සන්නිවේදන අවස්ථා ආගමික හා සමාජයීය වශයෙන් වර්ග කර දක්වයි.<br>▪ ආගමික හා සමාජයීය සන්නිවේදන අවශ්‍යතා සඳහා භාණ්ඩ භාවිතයේදී විවිධ උපක්‍රම යොදාගත් ආකාරය විස්තර කරයි.<br>▪ වර්තමානයේ විවිධ සමාජ අවශ්‍යතාවලදී මෙම වාද්‍ය භාණ්ඩ යොදා ගන්නා බවට කරුණු ඉදිරිපත් කරයි. | • අණ බෙර, රණ බෙර, මළ බෙර, වද බෙර හා හේවිසි වාදනය | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 10 ශ්‍රේණිය<br>111 වන වාරය | 2.0<br>නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | **2.5.1**<br>**නර්තන කලාව හා සබැඳි ප්‍රකාශන විධි ක්‍රම අධ්‍යයනය කරමින් අදහස් දක්වයි.** | ▪ ප්‍රකාශන විධික්‍රම ලෙස සතර අභිනය භාවිත වන බව ප්‍රකාශ කරයි.<br>▪ සතර අභිනය විස්තර කරයි.<br>▪ ප්‍රේක්ෂක රස වින්දනය උදෙසා සතර අභිනය වැදගත් වන බව ප්‍රකාශ කරයි. | ● සතර අභිනය | 02 |
| | 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | **5.2.1**<br>**ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ප්‍රවර්ධනට දායකවූවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි.** | ▪ නර්තන ශිල්පිනියන් පිළිබඳ ජීවන තොරතුරු රැස්කරයි.<br>▪ නර්තන ප්‍රවර්ධනයට දාවක වී ඇති ආකාරය විස්තර කරයි.<br>▪ ඔවුන්ගේ සේවය ඇගයීම සම්බන්ධ ව අදහස් දක්වයි.<br>▪ පරපුරෙන් පරපුරට ඔවුනට දැක්විය යුතු කෘතවේදීත්වය පිළිබඳ ව යෝජනා ඉදිරිපත් කරයි. | ● නර්තන ප්‍රවර්ධනයට දාවක වූවන් (ආචාර්ය වජිරා චිත්‍රසේන මිය, මිරැන්ඩා හේමලතා මිය) | 02 |
| | 5.0<br>ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | **5.4.1**<br>**ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ශාන්තිකර්මවල සුවිශේෂ ලක්ෂණ තුලනාත්මක ව දක්වයි.** | ▪ කොහොඹා යක් කංකාරිය, දෙවොල්මඩුව හා පහන් මඩුව ශාන්තිකර්ම හා සබැඳි කතා පුවත්වල අන්තර්ගත සමාජ ආකල්ප විස්තර කරයි.<br>▪ එම ශාන්තිකර්ම පැවැත්වීමේ අරමුණු දක්වයි.<br>▪ එම ශාන්තිකර්මවල අන්තර්ගත ගායන, වාදන, නර්තන, රංග වස්ත්‍රාභරණ, සැරසිලි හා රංග භාණ්ඩවල ලක්ෂණ තුලනාත්මකව ඉදිරිපත් කරයි. | ● කොහොඹා යක් කංකාරිය, දෙවොල්මඩුව හා පහන් මඩුව ශාන්තිකර්ම පිළිබඳ තොරතුරු තුලනාත්මකව | 03 |
| | 6.0<br>රසඥතා වර්ධනව සඳහා විවිධ කලාංගවල සුවිශේෂී ලක්ෂණ | **6.3.1**<br>**වෙනත් සංස්කෘතියකට අයත් නර්තන සම්ප්‍රදාය අධ්‍යයනය කරමින්** | ▪ කථකලි යන්න අර්ථ දක්වයි.<br>▪ කථකලි ප්‍රචලිත ප්‍රදේශ හා ඒ හා බැඳි සුවිශේෂ ආයතන නම් කරයි.<br>▪ කථකලි සංගීත සම්ප්‍රදාය හා වාද්‍ය භාණ්ඩ නම් කරයි. | ● කථකලි නර්තන සම්ප්‍රදාය පිළිබඳ තොරතුරු | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | විචාරයට ලක් කරයි. | **තොරතුරු ඉදිරිපත් කරයි.** | ▪ මෙම නර්තන සම්ප්‍රදාය ආහාර්ය අභිනයෙන් පොහොසත් බවට අදහස් ප්‍රකාශ කරයි. | | |
| | 6.0<br>රසඥතා වර්ධනව සඳහා විවිධ කලාංගවල සුවිශේෂී ලක්ෂණ විචාරයට ලක් කරයි. | **6.1.1**<br>**ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය (ඉඟිනළු) කලාවේ පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.** | ▪ ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය (ඉඟිනළු) යන්න පැහැදිලි කරයි.<br>▪ ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය (ඉඟිනළුවල) සුවිශේෂ ලක්ෂණ විමසයි.<br>▪ ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය (ඉඟිනළු) කලාවේ ආරම්භය හා විකාශනය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.<br>▪ ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය (ඉඟිනළු) ප්‍රාසාංගික ව ඉදිරිපත් කිරීමට භාවිත කර ඇති විධි ක්‍රම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | • ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය (ඉඟිනළු) කලාවේ ප්‍රභවයට බලපෑ කරුණු | 03 |
| | | | | | 36 |